**කතරගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු.933,869 ක් වුවද එය රු. 753,205 ක් ලෙස රු. 180,664 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | පොලී ආදායම අඩුවෙන් ගිණුම්ගත වීමේ වරද 2019 දී ජ'නල් මගින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබුණු වියදම රු. 54,865 ක් වූ සිවිලිමෙහි සහ මිලදීගෙන හා සවිකර තිබුණු රු. 804,570 ක් වටිනා ලී බඩු උපකරණ, යන්ත්‍ර සහ කාර්යාල උපකරණවල වටිනාකම් ප්‍රාග්ධනිතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2019 දී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපුම් කරන බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේ දරන ලද රු. 490,313 ක් වූ වියදම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ණයහිමියන් සඳහා ගැලපුම් නොකිරීමේ වරද නිවැරදි කර ගන්නා බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දරා තිබුණු රු. 217,783 ක් වූ ප්‍රාග්ධන වියදම්, අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | වැය ශීර්ෂ මාරුවී ගැලපීම් කිරීමේ වරද 2019 දී නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 321,444 ක් වූ ආදායම් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ණයගැතියන් යටතේ ගිණුම්ගත නොවීමේ වරද නිවැරදි කර ගනිමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දරන ලද රු. 52,986 ක රාජකාරී ඉටු කිරීමේ දීමනා සහ සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයට අදාල රු. 510,000 ක සභික දීමනා වෙනුවෙන් පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ණයගැතියන් යටතේ ගිණුම්ගත නොවීමේ වරද නිවැරදි කර ගනිමි. |
| (vii) | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනයේ (JICA) ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිමකර භාරදී තිබුණු ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මුළු වටිනාකම රු. 47,586,343 ක් වුවද රු. 20,856,343 ක් පමණක් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි මූල්‍යමය වටිනාකම අදාල ආයතනයෙන් ලබාගෙන ගිණුම්ගත කරමි. |
| (viii) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු. 300,000 ක් වූ ට්‍රැක්ටර් ටේලර් 2ක වටිනාකම රු.480,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | මූල්‍යමය වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කරමි. |
| (ix) | තොග ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩා ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.697,716 ක් වුවද එය රු.1,167,061 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | තොග වැඩියෙන් ගිණුම්ගතවීම 2019 දී නිවැරදි කරමි. |
| (x) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු. 290,494 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම් ලෙසට ගිණුම්ගත නොකර හිඟ හිටි වෙළඳ ස්ථාන කුලී ලෙසට ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම්වල වැරදියට සටහන්වීමේ වරද 2019 දී ගැලපුම් කරන බව දන්වමි. |
| (xi) | සභාවට පරිත්‍යාග කර තිබුණු ජල බවුසරය සහ අත්ට්‍රැක්ටරයක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | පරිත්‍යාග ගිණුම්ගත කළ යුතුවේ. | වාහන තක්සේරුගත වටිනාකම ගිණුම්ගත නොවීමේ වරද නිවැරදි කරමි. |

**(ආ)** **<u>නොසැසඳුණු පාලන ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තැන්පත්, කර්මාන්ත ණයගැතියෝ,සේවක ණය සහ හිඟ ටෙන්ඩර් දේපල ආදායම් යන ගිණුම් ශේෂයන් සහ ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 14,270,144 ක වෙනසක් පැවතුණි. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීනකර නොසැසඳීම්වලට හේතු සොයා බලා ගිණුම් නිවැරදි කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනසට හේතු සොයා බලා නිවැරදි කරමි. |

**(ඇ)** **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 7,259,127 ක වත්කම් විෂයකට අදාලව කාල විශ්ලේෂණ වාර්තාද රු. 16,616,272 ක ගෙවිය යුතු තැන්පතු විෂයයන් 4කට අදාලව යාවත්කාලීන කරන ලද ලේඛන, උපලේඛන සහ කාල විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | කාල විශ්ලේෂණ වාර්තාවක් මාසයක් ඇතුළත පිළියෙල කරන අතර ලේඛන නිවැරදි කිරීම මාසයක් ඇතුළත සිදුකරමි. |

**1.4** **<u>අනුකූල නොවීම්</u>**

**<u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්</u>**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | | | |
| (i) 24 වගන්තිය | ප්‍රාදේශීය සභාවට අයත් පාරවල් සහ පටු මංමාවත් වෙනුවෙන් මාර්ග ඉන්වෙන්ට්‍රියක් පවත්වා නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රියක් පවත්වාගත යුතුවේ. | මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 139 වගන්තිය | වරිපනම් බදු පැනවීමකට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවි යුතුවේ. | වාර වාර්තා කැඳවීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (iii) | 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 7,259,127ක හිඟ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,946,000 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,841,630 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 8,119,400 | 8,274,133 | 4,851,519 | 3,422,614 | 9,518,000 | 8,007,937 | 4,983,082 | 3,024,855 |
| (ii) | කුලී | 14,440,900 | 11,975,699 | 11,859,098 | 116,601 | 11,474,000 | 13,279,976 | 13,221,269 | 58,707 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 967,600 | 1,374,100 | 1,374,100 | - | 1,179,660 | 1,605,774 | 1,605,774 | - |
| (iv) | වෙනත් ආදායම් | 19,827,100 | 22,088,007 | 14,189,350 | 7,898,657 | 26,576,800 | 14,768,095 | 13,665,098 | 1,102,997 |
| | එකතුව | 43,355,000 | 43,711,939 | 32,274,067 | 11,437,872 | 48,748,460 | 37,661,782 | 33,475,223 | 4,186,559 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 43,711,939 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 11,437,872 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 26 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | විශේෂ වැඩ සටහන් පවත්වා කඩිනමින් හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | (i) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 6,198,636 ක් වූ වරිපනම් බදු ආදායමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 3,422,615 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 55 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 5,103,741 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුළදී රු. 3,836,511 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 75 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟ අයකර ගැනීමට ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන බව හා නීතිමය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | | සභාවට අයත් දේපල 12 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 5,458,237ක බදු මුදල් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු බදු මුදල් අයකර ගත යුතුවේ. | නීතිමය පියවර ගැනීම සඳහා නීතිඥ මහතාට ලිපිගොනු භාරදීමට කටයුතු කරමි. |

**2.2.4** <u>කුලී</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාවට අයත් කඩකාමර 118 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 946,270 ක කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ කඩකාමර කුලී අයකර ගත යුතුවේ. | කඩකාමර කුලී කඩිනමින් අයකර ගනිමි. |

**2.2.5** <u>වෙනත් ආදායම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාවට අයත් ගලි බවුසරය සහ ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු රු. 92,880ක් අයකර නොතිබුණි. | හිඟ යන්ත්‍ර කුලී අයකර ගත යුතුවේ. | තව දුරටත් හිඟව ඇත්තේ රු. 33,320 ක් වේ. එම හිඟය කඩිනමින් අයකර ගනිමි. |

**2.2.6** <u>ස්ථාවර වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 1,143,400ක ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ආදායම අයකර ගෙන නොතිබුණි. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගත යුතුවේ. | ආයතන දැනුවත් කර, මූලික සමීක්ෂණයක් සිදුකර මුදල් කඩිනමින් අයකර ගන්නා අතර දැන්වීම් පුවරු ඉවත් කිරීම හා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

**2.2.7** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ---------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 1,369,048 ක් හා හිඟ මුද්දර ගාස්තුව රු. 4,866,004 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | පෙර වර්ෂයට අදාල උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකරගෙන ඇත. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ---------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් ඉන් කාරණා 7 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

**(ආ)** ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණු අතර ඒ අනුව වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන | ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමි. |

නොතිබුණි. එම නිසා වාර්ෂික කාර්යසාධනය ඇගයීමේ හැකියාව අහිමිවී ගොස් තිබුණි.

(ඇ) <u>ඉටුනොකල කර්තව්‍යන්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවේ මිදුල සංවර්ධනය කිරීම සඳහා සෘජු ශ්‍රම පදනම යටතේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිපදවීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.60,000ක් වැය කර අච්චු සහ අමුද්‍රව්‍ය මිලදීගෙන තිබුණද, අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතුවේ. | සභා බලප්‍රදේශයේ ස්ථාන දෙකක පදික වේදිකා අලුත්වැඩියා සඳහා උප සභාපතිගේ නියෝග මත කුට්ටිගල් රැගෙන ගොස් ඇත. |

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන කටයුතු කරමි. |

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) <u>ලැබිය යුතු ගිණුම්</u> | | |
| (i) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වසර 1 කට අධික කාලයක සිට පැවත එන රු. 6,351,392 ක හිඟ වෙළඳ ස්ථාන | කුලී අයවිය යුතු පාර්ශවය හඳුනාගෙන හිඟ | ඉහත කඩ කුලී කපාහැරීම සඳහා කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| කුලී සමාලෝචිත වර්ෂය තුලදීද අයකරගෙන නොතිබුණු අතර එම කුලී අයවිය යුතු පාර්ශවයද හඳුනාගෙන නොතිබුණි. | කුලී අයකරගත යුතුවේ. | |
| (ii) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 1,604,560 ක හිඟ හිටි පොදු වෙළඳපොළ කුලී සහ හිඟ හිටි කඩකාමර කුලී සමාලෝචිත වර්ෂය තුලදීද අයකරගෙන නොතිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් නොකෙරිණි. | කාල විශ්ලේෂණයක් පිළියෙල කළ යුතු අතර හිඟ කුලී අයකරගත යුතුවේ. | හිඟ කුලිය කඩිනමින් අයකර ගනිමි. |

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

| | | |
|---|---|---|
| වසර 1 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු. 4,319,539 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ උපදෙස් මත කඩිනමින් නිරවුල් කරමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 11 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව පැවති සේවක පුරප්පාඩු 25 ක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | සේවක පුරප්පාඩු කඩිනමින් පිරවීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

**3.4** <u>වාහන උපයෝජනය</u>

**3.4.1** <u>වාහනවල අයිතිය පවරා නොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරන වාහන 20ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | වාහනවල අයිතිය පවරාගත යුතුවේ. | වාහනවල අයිතිය පවරාගැනීමට කටයුතු කරමි. |

**3.4.2** <u>දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේනිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------- |
| මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව සතු වාහන 8 කට අදාල දෛනික ධාවන සටහන් හා මාසික ධාවන සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් හා මාසික ධාවන සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. | ධාවන සටහන් කඩිනමින් විගණකාධිපති වෙත ඉදිරිපත් කරමි. |

**3.5** <u>හානි හා පාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | --------------------------------- |
| (අ) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ආදායම් පරීක්ෂක නිලධාරියෙකු විසින් අයකර තිබුණු රු.403,331ක විවිධ ආදායම් සභා අරමුදලට බැරකර නොතිබුණි. | මුළු මුදලම සභා අරමුදලට අයකරගත යුතුවේ. | සභාව වෙත මුදල් භාරදෙන ලෙස ලිඛිතව දැනුවත්කර ඇති අතර නීති මගින් කටයුතු කරමි. |
| (ආ) | සභාවේ සේවකයන් දෙදෙනෙකුට උප ලදුපත් පොත් 2ක් සහ එක් සේවකයෙකුට ප්‍රා.ස. 1 ලදුපත් පොතක් නිකුත්කර තිබුණු අතර එම ලදුපත් පොත් හෝ අයකල මුදල් කිසිවක් සභාවට ආපසු භාරදී නොතිබුණි. එමෙන්ම අයකල මුදල් පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ලදුපත් පොත් සහ අයකල මුදල් සභාවට ආපසු භාරගත යුතු අතර තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | ලදුපත් කිහිපයක මුදල් සභාව වෙත භාරදී ඇති අතර ඉතිරි ලදුපත්වලට අදාල මුදල් කඩිනමින් අයකර ගනිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඇසල උත්සව කාල සීමාව තුලදී ව්‍යාපාර ආයතන 11 ක් විසින් ප්‍රදර්ශනයකර තිබුණු දැන්වීම් පුවරු හා කොඩි සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු රු. 904,000 ක් සහ ව්‍යාපාර ආයතන 15 ක් විසින් ස්ථාන 8 ක පවත්වාගෙන ගොස් තිබුණු ප්‍රදර්ශන කුටි 19 ක් සඳහා අයවිය යුතු ගාස්තු රු. 1,360,000 ක් අයකර නොගැනීම නිසා සභා අරමුදලට එකතුව රු. 2,264,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | මුළු මුදලම සභා අරමුදලට අයකරගත යුතුවේ. | ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු නිදහස් කරන ලෙස නම්කර ඇති ආයතනවලින් මුදල් අය කර නොමැත. |
| (ඈ) | සභාවේ ස්ථිර සේවකයන් දෙදෙනෙකුට සහ කොමිස් පදනම මත සේවයේ යොදවා ඇති | ලදුපත් පොත් 9 සහ මුදල් සභාවට | අදාල ලදුපත් පොත් හා මුදල් කඩිනමින් ලබා ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| පුද්ගලයෙකුට නිකුත් කර තිබුණු 108,000 ක වාහන ගාල් කිරීමේ ගාස්තු අය කරන ලදුපත් පොත් 9ක් හෝ මුදල් කිසිවක් සමාලෝචිත වර්ෂය අවසානවන විටද සභාවට භාරදී නොතිබුණි. | රු. ලබාගත යුතුවේ. | කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 7 ක සියයට 11 සිට සියයට 86 දක්වාද වියදම් විෂයයන් 2ක සියයට 21 සහ සියයට 77 ක විචලනයන් පැවතුණි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | ඉදිරි වර්ෂවල අයවැය සැකසීමේදී විචලනයන් අවම වන ලෙස අයවැය ලේඛනය පිළියෙල කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 9 දිනැති චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/ 2009(01)දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇත. |